සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර I විභාගය - 2025 ජනවාරි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

2025-02-09
පස්වරු
[02.00 – 05.00]

පිටු ගණන : 06
ප්‍රශ්න ගණන: 06

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද* ***මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,*** *ඔබ වෙත සපයන ලද* ***පොත්වල උත්තර*** *ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත* ***කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව*** *අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 40)

## 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.10 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් කාණ්ඩ අතුරෙන්, මිනිස් වුවමනාවන් (human wants) පමණක් අඩංගු කාණ්ඩය කුමක් ද?

(1) රැකියා සුරක්ෂිතභාවය, නිවාස සහ ආහාර. (2) ජලය, නිවාස සහ ආහාර.

(3) ගවුම්, රැකියා සුරක්ෂිතභාවය සහ පාන්. (4) ආහාර, රැකියා සුරක්ෂිතභාවය සහ කමිස.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, සීමාසහිත පෞද්ගලික සමාගමක අවම අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාව තෝරන්න:

(1) 1. (2) 7. (3) 5. (4) 2.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරයේ විචල්‍යයක් **නොවන්නේ** කුමක් ද?

(1) සංවිධාන සංස්කෘතිය. (2) සැපයුම්කරුවන්.

(3) කළමනාකරණ ව්‍යුහය. (4) දැක්ම ප්‍රකාශය.

**1.4** පහත සඳහන් ඒවා අතුරෙන්, මුදල් වෙළෙඳපොළ (Money Market) සම්බන්ධයෙන් නිවැරදි වන්නේ කුමක් ද?

(1) කොටස් සහ ණයකර, මුදල් වෙළෙඳපොළේ උපකරණ වේ.

(2) එය වර්ෂයකට වඩා වැඩි කල් පිරීමක් ඇති මූල්‍ය වත්කම් වෙළඳාම් කිරීම සඳහා වන වෙළෙඳපොළක් වේ.

(3) මුදල් වෙළෙඳපොළේ සුරැකුම්පත් විකිණීමට සහ මිලදී ගැනීමට, කොළඹ කොටස් වෙළෙඳපොළ භාවිත කරනු ලබයි.

(4) ශ්‍රී ලංකා මහ බැංකුව සහ වාණිජ බැංකු, මුදල් වෙළෙඳපොළේ ඇති ප්‍රධාන ආයතන වේ.

**1.5** පහත සඳහන් ආයතන අතුරෙන්, තත්කාලීන දළ පියවීම් පද්ධතියේ (Real Time Gross Settlement System) සහභාගිකරුවෙක් **නොවන්නේ** කවුරුන් ද?

(1) සේවක භාරකාර අරමුදල (Employees' Trust Fund).

(2) ශ්‍රී ලංකා මහ බැංකුව.

(3) බලපත්‍රලාභී වාණිජ බැංකු.

(4) රජයේ සුරැකුම්පත් පිළිබඳ ප්‍රාථමික අලෙවිකරුවන්.

**1.6** පහත සඳහන් ඒවා අතුරෙන්, සන්නිවේදන ක්‍රියාවලියේ මූලිකාංගයක් **නොවන්නේ** කුමක් ද?

(1) යවන්නා.

(2) අවදානම.

(3) ප්‍රතිපෝෂණය (Feedback)

(4) මාධ්‍යය (Channel)

**1.7** පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න:

**(a)** තියුණු තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා අළුත් දේවල් නිර්මාණය කිරීම.

**(b)** පවතින සම්පත් කාර්යක්ෂමව භාවිත කිරීම සඳහා ව්‍යාපාර විවිධාංගීකරණය කිරීම.

**(c)** ආර්ථික වර්ධනය වේගවත් කිරීම සඳහා වැඩි වශයෙන් භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීම.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, ව්‍යවසායකත්වයේ වර්ධනය සඳහා හේතුව /හේතු වන්නේ:

(1) **(a)** පමණි.

(2) **(c)** පමණි.

(3) **(b)** සහ **(c)** පමණි.

(4) ඉහත සඳහන් සියල්ලම.

**1.8** රක්ෂණ ආවරණයක් ලබා ගැනීමෙන්, පුද්ගලයෙකුට රක්ෂණය කළ හැක්කේ;

(1) ණයගැතියෙකුගේ ලැබිය යුතු මුදල් නොලැබී යාමේ අවදානමයි.

(2) අනාගතයේදී ඇරීමට සිදුවන ව්‍යාපාර අලාභයි.

(3) කළමනාකරුවන්ගේ තීරණයක් නිසා වන අලාභයි.

(4) වෙළෙඳපොළ වෙනස්වීම නිසා වන අලාභයි.

**1.9** පහත සඳහන් ඒවා අතුරෙන්, රක්ෂණයේ මූලධර්මයක් **නොවන්නේ** කුමක් ද?

(1) හානිපූර්ණය (Indemnity).

(2) ආසන්නතම හේතුව (Proximate Cause).

(3) රහස්‍යභාවය.

(4) රක්ෂ්‍ය හිමිකම (Insurable Interest).

1.10 චෙක්පතක රේඛණය අවලංගු කල හැකි පුද්ගලයෙක් වන්නේ:

(1) අණකරුය. (2) බැංකුවයි. (3) අණලද්දායි. (4) ආදායකයායි.

*අංක 1.11 සිට 1.15 දක්වා ප්‍රශ්නවල දි ඇති එක් එක් ප්‍රකාශය **සත්‍ය** හෝ **අසත්‍යදැයි** දක්වන්න. **සත්‍ය** හෝ **අසත්‍ය** යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.11 ඇල්මැතිපාර්ශවයක් (a stakeholder) යනු සංවිධානය කෙරේ ඇල්මැති හෝ ඒ කෙරේ උනන්දුවක් දක්වන පුද්ගලයෙක්, පුද්ගලයින් කණ්ඩායමක් හෝ සංවිධානයක් වේ.

1.12 ව්‍යාසායකත්වය යනු ව්‍යාපාරික අවස්ථා හඳුනාගැනීම, නවෝත්පාදන මගින් මිනිස් අවශ්‍යතා තෘප්තිමත් කිරීම සහ අවදානම් කළමනාකරණය කිරීම වේ.

1.13 මුදල් වෙළෙඳපොළ, ප්‍රාථමික වෙළෙඳපොළ සහ ද්විතීයික වෙළෙඳපොළ වශයෙන් බෙදා දැක්විය හැකිය.

1.14 ණය පතක් (acredit card) විද්‍යුත් මුදල් (E-money) සඳහා උදාහරණයකි.

1.15 කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් [Small and Medium Size Enterprises (SMEs)], ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතයට සැළකිය යුතු ප්‍රතිශතයකින් (%) දායක වේ.

*අංක 1.16 සිට 1.20 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

1.16 ව්‍යවසායකත්වයේ නව ප්‍රවණතා දෙකක්(02) හඳුනා දක්වන්න.

1.17 කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ (SMEs) අසාර්ථකත්වයට බලපාන පාරිසරික සාධක දෙකක්(02) සඳහන් කරන්න.

1.18 "විධිමත් සංවිධානයක්" සහ "අවිධිමත් සංවිධානයක්" අතර වෙනස සඳහන් කරන්න.

1.19 ප්‍රාග්ධන වෙළෙඳපොළේ භාවිත වන උපකරණ සඳහා උදාහරණ දෙකක්(02) සඳහන් කරන්න.

1.20 පසුදාතම (මතුදාතම) (post-dated) චෙක්පතක් යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (එකකට ලකුණු 02 බැගින්, මුළු ලකුණු 40)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 40)

### 02 වන ප්‍රශ්නය

**ඇන් පෙරේරා,** 2020 දී, **ඇන් එන්ටප්‍රයිසස්** ලෙස කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. ඇගේ ව්‍යාපාරය ගෝලීය වෙළෙඳපොළට ව්‍යාප්තවීමත් සමඟ **ඇන්** තම ව්‍යාපාරය සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස පරිවර්තනය කිරීමට සැලසුම් කරමින් සිටී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) කේවලස්වාමි ව්‍යාපාරයක ඇති අවාසි දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) සීමාසහිත පෞද්ගලික සමාගමක් සංස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය ලියවිලි තුනක්(03) **හඳුනා දක්වන්න.** (ලකුණු 03)

(c) සීමාසහිත පෞද්ගලික සමාගමක ලක්ෂණ දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 03 වන ප්‍රශ්නය

**අවිශ්** යනු පොල් නිෂ්පාදන සැකසීමේ ව්‍යාපාරයේ යෙදෙන කුඩා පරිමාණ ව්‍යාපාරයක හිමිකරුවෙකි. ඔහු විසින් තම නිෂ්පාදන පහසුකම (production facility) සඳහා නව යන්ත්‍රයක් මිලදී ගැනීමට වාණිජ බැංකුවකින් ණය මුදලක් ලබාගන්නා ලදී. මෙම ආයෝජනය, ව්‍යාපාරයේ නිෂ්පාදන ධාරිතාවය ඉහළ නැංවීමට ඉවහල් විය. බැංකුවේ මූල්‍ය සේවා මඟින් ව්‍යාපාරයේ මූල්‍ය කටයුතු කළමනාකරණය කර ගැනීමට සහ කාලීනව ගෙවීම් කටයුතු සිදුකිරීම තහවුරු කිරීමටත් අවශ්‍ය සහාය ලැබුණි. **අවිශ්** තම ව්‍යාපාරයේ මූල්‍ය කටයුතු විධිමත් කර ගැනිම සඳහා නිරන්තරයෙන් චෙක්පත් භාවිත කරනු ලබයි.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) මුදලේ ප්‍රධාන කාර්යයක් ලෙස "විනිමය මාධ්‍යයක් ලෙස කටයුතු කිරීම" යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 02)

(b) ව්‍යාපාරික ආයතනයකට වාණිජ බැංකුවල පවත්වා ගෙන යා හැකි ගිණුම් වර්ග දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) ව්‍යාපාර ගනුදෙනු සිදුකිරීමේදී, මුදල්වලට වඩා චෙක්පත් භාවිත කිරීමේ වාසි හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

දියුණුවන ව්‍යාපාරයක්, ආචාරධර්මවලට මූලිකත්වය ලබා දෙමින්, ඇල්මැති පාර්ශවයන්ට ඇති වගකීම ඉටු කරමින් සහ තිරසර භාවිතයන් අනුගමනය කරමින් ක්‍රියාත්මක වේ. ආචාරධර්ම මූලධර්මයන්ට අනුකූලවීම මඟින් සමාගම කෙරෙහි විශ්වාසය ගොඩනැගෙන අතර, ආයෝජන ආකර්ශනය කර ගැනීමටත්, සමාගමේ කීර්තිනාමය ඉහළ නංවාලීමටත් හේතු වේ. තිරසර භාවිතයන් පිළිගැනීම මඟින් පාරිසරික බලපෑම අවම කිරීම සහ දිගුකාලීන ශක්‍යතාවය ප්‍රවර්ධනය කරමින් සුවදායී ගෝලීය පරිසරයකට දායක වීම, අපේක්ෂා කෙරේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ආචාරධර්ම සංග්‍රහයකින් ව්‍යාපාර ආයතනයක් විසින් බලාපොරොත්තු වන ප්‍රතිලාභ තුනක්(03) **ලැයිස්තුගත කරන්න**. (ලකුණු 03)

(b) සමාගමක් විසින් සමාජ වගකීම ඉටු කර ගැනීම සඳහා හඳුන්වාදෙනු ලබන උපාය මාර්ග / ක්‍රියාමාර්ග දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) තිරසාර භාවිතයන් මඟින් ව්‍යාපාරයකට අත්වන ප්‍රතිලාභ තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

විද්‍යුත් වාණිජ්‍යයේ දියුණුවත් සමඟ ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික ආනයන-අපනයන භූමිකාව වෙනස් වීමකට භාජනය වෙමින් පවතී. මාර්ගගත වෙළෙඳපොළවල් සහ ඩිජිටල් ගෙවීම් පද්ධති මඟින් සම්ප්‍රදායික වෙළෙඳ මාර්ග අවහිර කරමින් ඉතා පහසු අසම සම අවස්ථාවන් උදාකොට ඇත. මෙම ප්‍රවණතාවය මඟින් ව්‍යාපාරවලට ඔවුන්ගේ වෙළෙඳපොළ පුළුල් කර ගැනීමට සහ පිරිවැය අවම කර ගැනීමටත්, ව්‍යාපාර සඳහා නව ප්‍රවේශයන් විවෘත කර තිබේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) විදේශ වෙළඳාමේ (ජාත්‍යන්තර වෙළඳාමේ) භාවිත වන ප්‍රධාන ලියවිලි දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) නූතන ලෝකය සමඟ යෑමට ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික වෙළෙඳ ක්‍රියාකාරකම් තුළ අනුගමනය කළ යුතු නව ප්‍රවණතා දෙකක්(02) **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(c) විද්‍යුත් වාණිජ්‍යය (E-commerce) භාවිත කිරීමෙන් පාරිභෝගිකයින් හට අත්වන වාසි තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 20)

### 06 වන ප්‍රශ්නය

**ඒරියල්, ඒරියල් ටෙක්ස්ටයිල්ස්** නමින් කේවලස්වාමි ව්‍යාපාරයක් ආරම්භ කළ අතර, එය ළමුන් සඳහා වන ඇඟළුම් ව්‍යාපාරයේ නිරතව සිටී. එහි මෙහෙයුම් කටයුතු අපනයන වෙළෙඳපොළ දක්වා පුළුල් කිරීමට ඔහු විසින් සලකා බලමින් සිටී. ඔහු විසින් වැඩි ප්‍රාග්ධනයක් රැස්කිරීම සඳහා ව්‍යාපාරය සීමාසහිත පොදු සමාගමක් බවට පත් කිරීමටත්, ව්‍යාපාරයේ අභියෝග හඳුනා ගැනීමටත් උපදේශකවරයෙකු බඳවාගෙන ඇත.

දැනට ඔහු සතුව ශ්‍රී ලංකාව තුළ කර්මාන්තශාලා හතරක් ඇති අතර, පුහුණු ශ්‍රම බලකාය, සැපයුම්කරුවන් සමඟ පවත්වාගෙන යන දැඩි සම්බන්ධතාවයන් සහ ශක්තිමත් පාරිභෝගික පදනම ඔහුගේ ව්‍යාපාරයේ වර්ධනයට හේතු වී ඇත. කෙසේවුවද, සීමිත මූල්‍ය සම්පත්, ප්‍රධාන ගැනුම්කරුවන් කිහිප දෙනෙකු  මත රඳා සිටීම සහ තොරතුරු තාක්ෂණ දැනුම නොමැති වීම හේතුකොටගෙන ව්‍යාපාරය පුළුල් කිරීමේදී අභියෝගයන්ට මුහුණපෑමට සිදුව ඇත. සමහර යුරෝපීය රටවල කාන්තා ඇඟළුම් සඳහා ඉල්ලුමක් පවතී. ඔහු විසින් තිරසර භාවිතයන් (sustainable practices) පිළිපදිමින්, ගෝලීය ඉල්ලුම පිළිබඳ අවබෝධයෙන් ඇඟළුම් අයිතම රාශියක් සැපයීම සඳහා තම ව්‍යාපාරය විවිධාංගීකරණය කිරීමට සැලසුම්කොට ඇත. තවද, ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව රුපියල අවප්‍රමාණය වීම නිසා නිෂ්පාදන පිරිවැය විශාල ලෙස වැඩි වී තිබේ.

ආර්ථික පසු බෑසීම් (economic downturns) හේතුකොටගෙන, ශ්‍රී ලංකාවේ පාරිභෝගිකයින් තම වියදම් ද අඩුකොට ඇත. විලාසිතා ප්‍රවණතාවයන්හි දේශීය හා ජාත්‍යන්තර වෙනස්කම් නිසා ඉහළ යන තරඟකාරීත්වය සහ ස්වභාවික විපත්, දේශපාලන අස්ථාවරත්වය, වෙළෙඳ සීමාවන් සහ ශ්‍රම හිඟය යන සාධක හේතුවෙන් වන සැපයුම් දාම බිඳවැටීම් **ඒරියල් ටෙක්ස්ටයිල්ස්** ව්‍යාපාරයේ මෙහෙයුම්වලට බලපෑනු ලැබේ.

ඇඟළුම් නිෂ්පාදන කර්මාන්තය තුළ ප්‍රවාහන හා සැපයුම් සේවාවලට ඇති වැදගත්කම උපදේශකවරයා විසින් හඳුනාගෙන ඇත. කාර්යක්ෂම ප්‍රවාහනය, ගබඩාකරණය සහ තොග කළමනාකරණය, පාරිභෝගිකයින් හට තම නිෂ්පාදන නියමිත වේලාවට බෙදාහැරීම සහතික කිරීම සඳහා ඉතා වැදගත් වේ. **ඒරියල් ටෙක්ස්ටයිල්ස්** මගින් සැපයුම් මාර්ගවල ඇති අභියෝග අවම කිරීම සඳහා ප්‍රවාහනය, ගබඩා කිරීමේ පිරිවැය සහ තොග කළමනාකරණ ශිල්පීය ක්‍රම යනාදී සාධක පිළිබඳව ප්‍රවේශමෙන් සලකා බැලිය යුතු වේ.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) සීමාසහිත පොදු සමාගමක වාසි තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) ශදුඅත (SWOT) විශ්ලේෂණය භාවිතයෙන්, **ඒරියල් ටෙක්ස්ටයිල්ස්** හි ව්‍යාපාරික පරිසරය **තක්සේරු කරන්න.** (ලකුණු 06)

(c) ව්‍යාපාරයක් සඳහා ප්‍රවාහන මාධ්‍යයක් තෝරාගැනීමේදී, සලකා බැලිය යුතු තීරණාත්මක සාධක තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(d) හොඳ ප්‍රවාහන පද්ධතියක්, **ඒරියල් ටෙක්ස්ටයිල්ස්** හට උපකාර වන ආකාර තුනක්(03) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(e) ව්‍යවසායකයෙකු ලෙස **ඒරියල්** ට අවශ්‍ය කරනු ලබන ව්‍යවසායකත්ව කුසලතා තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(මුළු ලකුණු 20)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | **අදින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | **සඳහන් කරන්න** | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | **හඳුනා දක්වන්න** | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | **හඳුනාගන්න** | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | **අර්ථකතනය කරන්න** | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | **විස්තර කරන්න** | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | **පැහැදිලි කරන්න** | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | **සසඳන්න** | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තිරණය කරන්න. |
| | | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | **පිළියෙල කරන්න** | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | **ප්‍රදර්ශනය කරන්න** | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසඳීම. | **සන්නිවේදනය කරන්න** | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **සමානකම් බලන්න** | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | **විමසන්න** | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දැ හඳුනා ගැනීම. |
| | | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |